# 1.2 ගව වෙදකම පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මක අධ්‍යයනයක්

එම් බී බුද්ධික ජයසුන්දර
අංක 235/සී, ඉහළයාගොඩ, ඉඹුල්ගොඩ.

## ABSTRACT

ලාංකිකයන්ගේ ජීවිතවලට වඩාත් සමීප වූ ගවයා දේශීය පාරම්පරික පශු වෛද්‍ය ක්‍රමය සමඟ විශේෂයෙන් සම්බන්ධ වූ සත්ත්වයෙකි. ගවයින්ට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ප්‍රතිකාර කෙරෙන වෙනම ම වෛද්‍ය ශාස්ත්‍රයක් 'ගව වෙදකම' නමින් පාරම්පරිකව පැවත එයි. ගව රෝග හා ඒ සඳහා භාවිත කළ ප්‍රතිකර්ම විධි පිළිබඳව අතීතයේ දී ශ්‍රී ලාංකිකයන් සතුව තිබූ දැනුම සම්බන්ධයෙන් අවබෝධයක් ලැබීමට දැනට ශේෂව ඇති ප්‍රධාන ම මූලාශ්‍රය වනුයේ 'පපංචසූදනී'නම් අට්ඨකථාවයි. පසු කලෙක රචනා වූ 'ගෝ රත්නය, ගව වෙද පොත, ගව සිද්ධිසාර චිකිත්සා' ආදී කෘතිවල ගවයින්ට වැළඳෙන රෝග සහ ඒ සඳහා භාවිත ප්‍රතිකර්ම විධි පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.

ගව වෙද පොත්වල සඳහන් වන පරිදි හත් කුලයකට බෙදා දැක්වෙන සමස්ත ගව වර්ගයාට වැළඳෙන රෝග හාරදහස් හාරසිය හතළිස් අටකි. (4448) මෙම රෝග සුව කිරීමට අනුගමනය කර ඇති ප්‍රතිකාර විධි පිළිබඳ අධ්‍යයනය කරන විට ඒවා ප්‍රධාන වශයෙන් කොටස් තුනකට වර්ග කර දැක්විය හැකිය. එනම්,

1. මන්ත්‍ර ගුරුකම් සහිත කෙම් ක්‍රමය
2. ඖෂධීය ප්‍රතිකාර ක්‍රමය
3. යන්ත්‍ර පිළිස්සුම් ක්‍රමය

පාරම්පරික දේශීය පශු වෛද්‍ය ශාස්ත්‍රයට ගව වෙදකම නමින් වෛද්‍ය ක්‍රමයක් එක් වූයේ ගව සම්පත කෙරෙහි ගැමියන් තුළ වූ කෘතවේදී ආකල්පය නිසා ය. නමුත් නවීන විද්‍යාවේ දියුණුවත් සමඟ ගවයා මිනිසාගේ දෛනික ජීවිතයේ කටයුතුවලින් දුරස් වන විට දේශීය ගව වෙදකම ද එහි පාරම්පරික පැවැත්ම තහවුරු කළ ගව වෙදමහතාගේ භූමිකාව ද සිංහල සංස්කෘතියෙන් ක්‍රමයෙන් දුරස් වෙමින් පවතී. නූතන පරම්පරාව මෙබඳු වෘත්තියක් රැක ගැනීම කෙරෙහි උනන්දුවක් නොදක්වන බැවින් වයෝවෘද්ධ පාරම්පරික ගව වෙදුන්ගේ ඇවෑමෙන් දේශීය ගව වෙදකම ද අභාවයට යෑමේ අවධානමකට මුහුණ දී සිටියි.

මේ අධ්‍යයනයේ පරමාර්ථය වනුයේ පැරැන්නන් විසින් ගව රෝග සුව කිරීමේ දී සාර්ථක ප්‍රතිඵල අත්කර ගත්, ජනශ්‍රැති අංගයක් වශයෙන් සංස්කෘතික වටිනාකමක් ද උසුලන ගව වෙදකම පිළිබඳ ජනශ්‍රැති විද්‍යාත්මක අධ්‍යයනයක නිරත වීමයි.